බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව			
අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2025 උපකාරක ප්‍රශ්න පත්‍රය			
ශ්‍රේණිය: 11	ඉතිහාසය	පත්‍රය: I	කාලය : පැය 01යි

උපදෙස්:

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) ශ්‍රී ලංකාවේ දේශීය සාහිත්‍ය මූලාශ්‍රය අතර වඩාත්ම පැරණි කෘතිය ලෙස සැලකෙන්නේ මින් කුමක් ද?
(1) ථූපවංශය (2) බෝධිවංශය (3) මහාවංශය (4) දීපවංශය

(02) රිබෙයිරෝගේ ලංකා ඉතිහාසය පිළිබඳ ග්‍රන්ථය අයත් වන්නේ කුමන මූලාශ්‍රය වර්ගයට ද?
(1) පෘතුගීසි (2) ඕලන්ද (3) ඉංග්‍රීසි (4) අරාබි

(03) පූර්ව ඓතිහාසික යුගයේ මානවයින් විසූ බවට සාක්ෂි ලැබෙන ස්ථානයක් වන්නේ,
(1) පාහියන්ගල (2) රංචාමඩම (3) මාතොට (4) පොතාන

(04) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ගංගා නිම්නය තුළට අවතීර්ණ වන ආකාරය පිළිබඳ අධ්‍යයනයක් සිදුකර ඇත්තේ මින් කුමන ගංගා නිම්නය ආශ්‍රිතව ද?
(1) දැදුරු ඔය (2) මා ඔය (3) කිරිඳි ඔය (4) කුඹුක්කන් ඔය

(05) පළමුවරට මෙරට විශාල ප්‍රමාණයේ වැව් ඉදි කිරීමට පුරෝගාමී වූ රජතුමා කවුරුන් ද?
(1) දේවානම්පියතිස්ස (2) වසභ (3) මහසෙන් (4) ධාතුසේන

(06) පුරාණ කාලයේ ගම් කිහිපයක පැවති වැව් පද්ධති පාලනය කිරීමට නායකත්වය සඳහා තෝරාගත් පුද්ගලයා හඳුන්වා ඇති නාමය වන්නේ,
(1) ගෘහපති (2) ගමික (3) පරුමකලු (4) පරුමක

- පහත ප්‍රකාශ ඇසුරෙන් අංක 07, 08 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - දුටුගැමුණු කුමරුගෙන් පසු සද්ධාතිස්ස කුමරු රජවීම.
B - වසභ රජුගෙන් පසු වංකනාසිකතිස්ස කුමරු රජවීම.
C - දෙවන රාජසිංහ රජුගෙන් පසු දෙවන විමලධර්මසූරිය කුමරු රජවීම.
D - කාශ්‍යප රජුගෙන් පසු මුගලන් කුමරු රජවීම.

(07) සහෝදරයාගෙන් සහෝදරයාට රජකම උරුමවීමේ අවස්ථාවක් වන්නේ,
(1) A සහ D ය. (2) A සහ C ය. (3) B සහ C ය. (4) B සහ D ය.

(08) පියාගෙන් පුතාට රජකම උරුමවීමේ අවස්ථාවක් වන්නේ,
(1) A සහ B ය. (2) B සහ C ය. (3) C සහ D ය. (4) B සහ D ය.

(09) වල්ලිපුරම් රන්පත් ලේඛනය මගින් හෙළිවන තොරතුරක් වන්නේ,
(1) සිත්නාරුබිම බුදල්නා විසින් කිත්ති කුමරු ඇතුළු රාජකීය පවුල වෙත ලබාදුන් රැකවරණය යි.
(2) පත්තිනි දේවාලයක් විවෘත කිරීමේ උත්සවයකට පළමුවන ගජබාහු රජු චේර රාජ්‍යයට පැමිණි බව යි.
(3) මෙරට කන්න තුනක් වී වගා කළ බව යි.
(4) සෘෂිගිරි ඇමති විසින් පියංගුකතිස්ස විහාරය ඉදිකළ බව යි.

Scanned with CamScanner

(10) ගෝකණ්ණතිත්ථ වරායට සමීපව ඉදිකරනු ලැබූ ඓතිහාසික හින්දු කෝවිල හඳුන්වන්නේ කුමන නමින් ද?

(1) මුන්නේශ්වරම් කෝවිල
(2) තිරුකේතීශ්වරම් කෝවිල
(3) කෝනේශ්වරම් කෝවිල
(4) නල්ලූර් කෝවිල

(11) පැරණි කාලයේ කර්මාන්තවල නියැලුණු ශිල්පීන් හැඳින් වූ නම් I තීරුවේ ද, ඔවුන් නියැලුණු කර්මාන්තය II තීරුවේ ද දැක්වේ. I තීරුවේ අනුපිළිවෙළට II තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

I තීරුව	II තීරුව
1. කුඹකර	A - යකඩ කර්මාන්තය
2. දටික	B - ඇත්දත් කැටයම් කර්මාන්තය
3. කබර	C - රන් කර්මාන්තය
4. තුලාධාර	D - මැටි කර්මාන්තය

(1) A, B, C, D (2) B, D, A, C (3) D, B, A, C (4) D, C, A, B

(12) විදේශවලින් භාණ්ඩ ආනයනය කිරීමේ දී වරායවලින් රේගු බදු අයකර ගත් බවට තොරතුරු සඳහන් සෙල්ලිපිය වන්නේ,

(1) ගොඩවාය සෙල්ලිපිය යි.
(2) බුද්ධන්නෙහෙල සෙල්ලිපිය යි.
(3) හෝපිටිගමුව සෙල්ලිපිය යි.
(4) සිතුල්පව්ව සෙල්ලිපිය යි.

(13) පැරණි සීගිරිය නාගරික සැලැස්මේ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණය වන්නේ,

(1) නගරයේ ආරක්ෂාව සඳහා වැඩි අවධානයක් යොමුකර තිබීම යි.
(2) අලංකරණය හා කලා නිර්මාණ සඳහා ප්‍රමුඛතාවයක් ගෙන තිබීම යි.
(3) ජල පහසුකම් සහිත අලංකාර උද්‍යාන සකස් කර තිබීම යි.
(4) සියලුම ඉදිකිරීම් සැලසුම් සහිත ගණිතානුකූල ආකෘතියකට නිමකර තිබීම යි.

(14) වී, උඳු, මුං සහ තල යන ධාන්‍ය වර්ග පිළිබඳ තොරතුරු ඇතුළත් වන කීර්ති ශ්‍රී මේඝවර්ණාභය රජු විසින් කරවන ලද සෙල්ලිපිය මින් කුමක් ද?

(1) වේවැල්කැටිය සෙල්ලිපිය
(2) තෝණිගල සෙල්ලිපිය
(3) කොණ්ඩවට්ටවාන් සෙල්ලිපිය
(4) බුද්ධන්නෙහෙල සෙල්ලිපිය

(15) පහත A හා B ඇසුරෙන් පිළිතුරු සපයන්න.

A - කාන්තාව මව්වරුන් ලෙස ඉසිලූ වගකීම නිසා ගෞරවාදයට පත්වීම.

B - කාන්තාවට විවාහය සඳහා සුදුසුකම් ලැබීමට වයස අවුරුදු දහසය ඉක්මවීම.

පැරණි සමාජයේ කාන්තාව සම්බන්ධයෙන්,

(1) A හා B සත්‍ය වේ.
(2) A හා B අසත්‍ය වේ.
(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ.
(4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

- රජවරු රාජ්‍යත්වයට පත්වීමට පෙර හාවිත කළ නම් කිහිපයක් පහත A සිට E දක්වා සඳහන් වේ.

A - සපුමල් කුමරු B - කන්නසාමි කුමරු C - මහා අස්ථාන කුමරු

D - ටිකිරි කුමරු E - අම්බුලුගල කුමරු

(16) අටවන වීර පරාක්‍රමබාහු, හයවන බුවනෙකබාහු සහ පළමුවන රාජසිංහ යන රජවරුන්ට අදාළ වන නම් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) E, A, D (2) A, E, D (3) C, A, D (4) A, C, B

Scanned with CamScanner

(17) යාපන රාජධානියේ ආරම්භක පාලකයා ලෙස සැලකෙන්නේ,
(1) පරරාජසේකරම් ය. (2) ඒදිරිමානසිංහම් ය. (3) සංකිලි ය. (4) විජය කුලංකෙ ය.

(18) මහනුවර රාජධානියේ මහවාසල නිලධාරී තනතුරකට අයත් නොවන්නේ මින් කුමන තනතුර ද?
(1) රටේ රාල (2) මහලේකම්
(3) හළුවඩන නිලමේ (4) කවිකාර මඩුවේ මුහන්දිරම්

(19) රදල ප්‍රධානීන් කළ සේවය වෙනුවෙන් රජතුමා විසින් ප්‍රදානය කළ ඉඩම් හඳුන්වා ඇත්තේ කුමන නමින් ද?
(1) ගබඩාගම් (2) පරවේණිගම් (3) නින්දගම් (4) දේවාලගම්

(20) අවසාන විනිශ්චය නම් චිත්‍රය හා සිස්ටයින් මන්දිරයේම ඇඳ ඇති ආදම්ගේ චිත්‍රය නිර්මාණය කළ චිත්‍ර ශිල්පියා වන්නේ,
(1) ලියනාඩෝ ඩාවින්චි ය. (2) මයිකල් ආන්ජලෝ ය.
(3) රෆායල් සැන්ඩි ය. (4) බොට්ටිචෙල්ලි ය.

(21) පුනරුද සමයේ දී කලා ශිල්ප ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කමක් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) සියලු කලා ශිල්පීන් ශ්‍රේණි වශයෙන් සංවිධානය වී සිටීම.
(2) කලාකෘතිවලට අනුග්‍රහය දැක්විය හැක්කේ පල්ලියට පමණි.
(3) ලෞකික රස විඳිනයට මුල්තැන දෙන කලාකෘති රාශියක් බිහිවිය.
(4) මෙකල ආගමට නැඹුරු වූ කලාකෘති බිහිවීම විශේෂ ලක්ෂණයකි.

(22) මුල්ලේරියා සටනේ දී පෘතුගීසීන් අන්ත පරාජයකට පත් කිරීමට සීතාවක රාජසිංහ රජු සමත් වුවද, ඔවුන් ලංකාවෙන් නෙරපා හැරීමට නොහැකිවීමට හේතු වූ කරුණක් වන්නේ,
(1) උඩරට පාලකයන්ගෙන් සහායක් නොලැබීම යි.
(2) සිංහල හමුදා සේනාධිපතිවරු අතර පැවති අසමගිය යි.
(3) පුහුණු කරන ලද දේශීය හමුදාවක් රජුට නොසිටීම යි.
(4) රජතුමාට ප්‍රබල නාවුක බලයක් නොතිබීම යි.

(23) උඩරට රාජධානිය තුළ පෘතුගීසීන් බලය තහවුරු කර ගැනීම සඳහා පැවැත් වූ සටන් i තීරුවේ ද, ඒ සඳහා නායකත්වය ගත් පෘතුගීසි සෙන්පතියන් ii තීරුවේ ද දැක්වේ. i තීරුවේ අනුපිළිවෙළට ii තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

i තීරුව	ii තීරුව
1. දන්තුරේ සටන	A - දියෝගෝ ද මේලෝ
2. රන්දෙනිවල සටන	B - ජෙරනිමෝ ද අසවේදු
3. ගන්නෝරුව සටන	C - පේරෝලෝපෙස් ද සූසා
	D - කොන්ස්තන්තීනු ද සා

(1) C, D, A (2) C, B, A (3) B, D, A (4) C, D, C

(24) කාර්මික විප්ලවය නිසා දේශපාලන ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කමක් වන්නේ,
(1) ආනයන අපනයන වෙළෙඳ රටාවක් බිහිවීම යි.
(2) වෘත්තීය සංගම් බිහිවීම යි.
(3) නගර සංඛ්‍යාව සහ නගරවල විශාලත්වය වර්ධනය වීම යි.
(4) බද්ධ ව්‍යාපාර සමාගම් බිහිවීම යි.

(25) පෙනී තැපැල් සේවය ආරම්භ කරන ලද්දේ කිනම් රටක ද?
(1) ප්‍රංශය (2) ජර්මනිය (3) ඉතාලිය (4) එංගලන්තය

Scanned with CamScanner

(26) පහත සඳහන් ඓතිහාසික සිදුවීම් අනුපිළිවෙළට පෙළ ගැස් වූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

A - ප්‍රංශ හමුදාව ඕලන්දය ආක්‍රමණය කිරීම.
B - ජෝන් ෆයිබස් නම් ඉංග්‍රීසි දූතයා උඩරටට පැමිණීම
C - පෙඩ්රික්නෝර්ත් ආණ්ඩුකාරවරයා දිවයිනට පැමිණීම.
D - ත්‍රිකුණාමලය ලන්දේසි බලකොටුව ඉංග්‍රීසින් අතට පත්වීම.

(1) B, D, A, C (2) B, A, D, C (3) A, B, C, D (4) A, B, D, C

(27) ක්‍රි.ව. 1797 දී ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ඇති වූ කැරැල්ල සඳහා ප්‍රධාන වශයෙන් බලපාන ලද බදු වර්ගය වූයේ,

(1) මාළු බද්ද ය. (2) ලුණු බද්ද ය.
(3) පොල්ගස් බද්ද ය. (4) දුම්කොළ බද්ද ය.

(28) අනගාරික ධර්මපාලතුමා, අරුමුග නාවලර්තුමා හා සිද්දිලෙබ්බෙ මහතා යන පුද්ගලයන්ගේ ක්‍රියාකලාපවල කැපීපෙනෙන පොදු ලක්ෂණය මින් කුමක් ද?

(1) අමද්‍යප ව්‍යාපාරයේ සාර්ථකත්වයට කටයුතු කිරීම.
(2) ජාතික සමගිය වර්ධනය කිරීම සඳහා සාමුහිකව කටයුතු කිරීම.
(3) ස්වකීය ආගම හා සංස්කෘතිය පිළිබඳ පුනර්ජීවයක් ඇති කිරීමට කටයුතු කිරීම.
(4) බ්‍රිතාන්‍ය පාලනයෙන් ශ්‍රී ලංකාව මුදවා ගැනීමට කටයුතු කිරීම.

(29) බෞද්ධ පුනරුද ව්‍යාපාරයේ දී පැවැත් වූ පංචමහාවාද අතුරින් ජාත්‍යන්තරව ප්‍රසිද්ධියට පත් වූ වාදය වූයේ,

(1) වරාගොඩ වාදය යි. (2) උදන්විට වාදය යි.
(3) ගම්පොළ වාදය යි. (4) පානදුරාවාදය යි.

(30)
- අග්‍රාණ්ඩුකාර තනතුර ස්ථාපනය කිරීම.
- ද්වි මණ්ඩල පාර්ලිමේන්තුව පිහිටුවීම.
- අධිකරණ සේවා කොමිසම පිහිටුවීම

ඉහත සඳහන් යෝජනා ක්‍රියාත්මක වූයේ කුමන ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය යටතේ ද?

(1) සෝල්බරි (2) ඩොනමෝර් (3) මැනිං (4) කෝල්බෘක්

(31) ඩොනමෝර් ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක වීමෙන් පසුව ශ්‍රී ලංකාවේ ඇති වූ දේශපාලන වෙනස්කමක් වූයේ මින් කුමක් ද?

(1) ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම. (2) රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම.
(3) දිවයින පළාත් පහකට බෙදීම. (4) පළාත්බද නියෝජන ක්‍රමය හඳුන්වාදීම.

- **පහත A සිට D දක්වා ප්‍රකාශ ඇසුරෙන් 32 සහ 33 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - උඩරට ප්‍රදේශවල ස්ථාන කිහිපයක වගාවක් ලෙස ආරම්භ විය.
B - වඩා හොඳින් වගාකළ හැකිවූයේ මාතලේ දිස්ත්‍රික්කයේ පමණි.
C - සෙවන අවශ්‍ය නිසා අමතර වියදමක් දැරීමට සිදුවිය.
D - දිලීර රෝගයක් පැතිරයාම නිසා වගාව පරිහානියට පත්විය.

(32) කෝපි වගාව සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ දෙක ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) A හා B ය. (2) A හා D ය. (3) B හා D ය. (4) B හා C ය.

(33) කොකෝවා වගාව සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ දෙක ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) A හා C ය. (2) B හා D ය. (3) B හා C ය. (4) C හා D ය.

(34) ජනමත විචාරණයක දී ජයග්‍රහණය ලැබීම සඳහා වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් කොපමණ ප්‍රමාණයක් ලබාගත යුතු ද?

(1) 40% කට වැඩිවිය යුතු ය. (2) 50% කට වැඩිවිය යුතු ය.
(3) 60% කට වැඩිවිය යුතු ය. (4) 75% කට වැඩිවිය යුතු ය.

Scanned with CamScanner

(35) මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ පළමු අදියර යටතේ රජරට වියලි කලාපයට ජලය ගෙනයාම සිදුවූයේ කුමන ජලාශය මගින් ද?

(1) බෝවිතැන්න (2) කොත්මලේ (3) වික්ටෝරියා (4) මාඳුරු ඔය

(36)
- පර්ල් වරායට බෝම්බ හෙළීම
- කොළඹට සහ ත්‍රිකුණාමලයට බෝම්බ හෙළීම

දෙවන ලෝක සංග්‍රාමයේ දී ඉහත සඳහන් ක්‍රියාවන් සිදුකළ රට වන්නේ,

(1) ඇමරිකා එක්සත් ජනපදය යි. (2) ජර්මනිය යි.
(3) ජපානය යි. (4) බ්‍රිතාන්‍යය යි.

(37) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලයේ නිත්‍ය සාමාජික රටවලට හිමි විශේෂ වරප්‍රසාදය වන්නේ,

(1) ගැටුම් පවතින සාමාජික රටවලට මානුෂීය ආධාර අනුමත කිරීමට ඇති බලය යි.
(2) විපත්වලට මුහුණදුන් සාමාජික රටවලට මානුෂීය ආධාර අනුමත කිරීමට ඇති බලය යි.
(3) අවුරුදු පහකට වරක් මහලේකම්වරයෙකු පත් කිරීමට ඇති බලය යි.
(4) කිසියම් යෝජනාවක් සම්බන්ධයෙන් නිෂේධ බලය පාවිච්චි කිරීමට ඇති හැකියාව යි.

- පහත A, B, C හා D යටතේ ප්‍රකාශ යුගලය බැගින් දක්වා ඇත. මෙහි පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාව පරීක්ෂා කර 38 සිට 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - 1. ඇමරිකන් නිදහස් සටන
2. පිලඩෙල්පියා සම්මේලනය

B - 1. හත් අවුරුදු යුද්ධය
2. ඔක්තෝබර් විප්ලවය

C - 1. බොස්ටන් තේ සාදය
2. ඇමරිකන් විප්ලවය

C - 1. ප්‍රංශ විප්ලවය
2. දාහතරවන ලුවී රජු

(38) පළමුවැන්න ඇතිවීමට දෙවැන්න හේතුවක් වූ බව දැක්වෙන යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

(39) දෙවැන්නේ ප්‍රතිඵලයක් ලෙස පළමුවැන්න සිදු වූ බව දැක්වෙන යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

(40) පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවයක් **නොදැක්වෙන** යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

Scanned with CamScanner

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2025
උපකාරක ප්‍රශ්න පත්‍රය

ශ්‍රේණිය: 11	ඉතිහාසය	පත්‍රය: II	කාලය : පැය 03යි

- **I** කොටසේ පළමු පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- **II** කොටසින් ප්‍රශ්න හතරකට ද, **III** කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

I කොටස

(01) (අ) (i) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

පල්ලවවංක, කන්තරෝඩය, දැදුරු ඔය, පොලොන්නරුව, පදවිය වැව, දඹදෙනිය, කල්පිටිය, ගම්පොල, පොතාන, කළුගඟ, රාවනා ඇල්ල ලෙන, කලා වැව (ලකුණු 12 යි)

(ii) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කර නම් කරන්න.

කාම්බෝජය, ප්‍රංශය, කැලිකට්, පර්සියන් බොක්ක, බනාවිය, අරාබිය (ලකුණු 06 යි)

(ආ) (i) පහත A, B, C හා D යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - එදා හෙළදිව නැමැති කෘතිය රචනා කරන ලද ඉංග්‍රීසි ජාතිකයාගේ නම කුමක් ද?

B - හෝපිටිගමුව ටැම් ලිපිය කර වූ රජතුමා කවුරුන් ද?


C - බැටලු වර්ග අභිජනන ආශ්‍රිත සොයා ගැනීම් සිදුකළ පුද්ගලයා නම් කරන්න.

D - උතුරු ඇමෙරිකානු ප්‍රදේශවල ජීවත් වූ ස්වදේශිකයන් හැඳින්වූයේ කුමන නමින් ද?

(ලකුණු 04 යි)

- පහත A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

A



(ii) 1. A රූපයේ දැක්වෙන නිර්මාණය කුමක් ද?

2. මෙය සොයා ගන්නා ලද්දේ කුමන ස්ථානයකින් ද?

3. මෙය අයත්වන ඓතිහාසික යුගය නම් කරන්න.

4. මින් කවර තාක්ෂණික දියුණුවක් පිළිබිඹුවේ ද?

(ලකුණු 04 යි)

B



(iii) 1. B පින්තූරයේ දැක්වෙන මාලිගය හඳුන්වන නම කුමක් ද?

2. මෙය පිහිටියේ කුමන රටේ ද?

3. මෙය හා සම්බන්ධ ඓතිහාසික විප්ලවය නම් කරන්න.

4. මෙහි වාසය කළ රජවරු අයත්වන රාජවංශය හඳුන්වන්නේ කුමන නමින් ද? (ලකුණු 04 යි)

Scanned with CamScanner

II කොටස

(02) (අ) (i) ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු ඇතුළත් පහත සඳහන් මූලාශ්‍ර රචනා කරන ලද කතුවරුන් කවුරුන් දැයි A, B, C අනුපිළිවෙළින් ලියන්න.

A - නැචුරාලිස් හිස්ටෝරියා
B - ඩිමුන්ඩෝ
C - ඉන්ඩිකා (ලකුණු 03 යි)

(ii) සාහිත්‍ය මූලාශ්‍රවල ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) දේශීය සාහිත්‍ය මූලාශ්‍රය අතුරින් මහාවංසයට ඇති වැදගත්කම කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) ඉතිහාසය හැදෑරීම සඳහා පුරා විද්‍යාත්මක මූලාශ්‍රය ප්‍රයෝජනවත් වන ආකාරය උදාහරණ තුනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(03) (i) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයේ විසූ මානවයින් පිෂ්ටය ලබා ගැනීමට භාවිත කළ ශාක ආහාර වර්ග තුනක් නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) මෙරට ප්‍රාග් ඓතිහාසික මානවයින් වාසය කරන ලද,

(a) කඳුකර එළිමහන් වාසස්ථාන දෙකක් සහ
(b) වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථාන දෙකක් ද ලියා දක්වන්න (ලකුණු 04 යි)

(iii) ප්‍රාග් ඓතිහාසික යුගයේ පැවති අභිචාර විධි පිළිබඳ උදාහරණ දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) පූර්ව ඓතිහාසික යුගයේ පැවති තාක්ෂණයේ ස්වරූපය පිළිබඳ කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(04) (i) පහත සඳහන් වැව් ඉදිකළ පාලකයින් A, B, C අනුපිළිවෙළින් නම් කරන්න.

A - කලා වැව
B - මින්නේරිය වැව
C - පදවිය වැව (ලකුණු 03 යි)

(ii) පුරාණයේ මෙරට යකඩ නිස්සාරණ තාක්ෂණයක් පැවති බවට තොරතුරු හමු වූ ප්‍රදේශ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) අතීත ශ්‍රී ලංකාවේ දියුණු වෛද්‍ය තාක්ෂණයක් පැවති බව නිදසුන් දෙකක් සහිතව විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) අතීතයේ මෙරට පැවති විශ්මිත වාරි තාක්ෂණය පිළිබඳ කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(05) (i) ඓතිහාසික යුගයේ දී ශ්‍රී ලංකාවේ පැවති සමාජ සංවිධානය තුළ නිෂ්පාදනය භුක්ති විඳින පිරිසට අයත් පුද්ගලයින් තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) සෙල්ලිපිවල සඳහන් පහත බදු වර්ග අය කරන ලද්දේ කුමන කාර්යයන් උදෙසා දැයි අනුපිළිවෙළින් ලියන්න.

A - කැති අඩ
B - දකපති
C - බොජකපති
D - මතරමජීබක (ලකුණු 04 යි)

(iii) අතීතයේ සමාජයේ මෙරට පැවති දියුණු කර්මාන්ත දෙකක් පිළිබඳ උදාහරණ සහිත ව විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) පැරණි සමාජයේ පැවති ආහාර රටාව වර්තමානයේ නීරෝගිමත් ජීවිතයක් ගත කිරීමට දායක කරගත හැකි ආකාරය නිදසුන් තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

Scanned with CamScanner

(06) (i) මහනුවර රාජධානියේ රාජ්‍යත්වයට පත් වූ නායක්කර් වංශික රජවරු තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පළමුවන විමලධර්මසූරිය රජතුමා මහනුවර රාජධානියේ ආර්ථික දියුණුව පිණිස අනුගමනය කළ පියවර දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) මහනුවර රාජධානියට එල්ල වූ පෘතුගීසි ආක්‍රමණ අසාර්ථක වීමට සහ රාජධානිය තව දුරටත් ආරක්ෂා වීමට බල පෑ හේතු එක බැගින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) මහනුවර රාජධානිය සම්බන්ධ ලන්දේසීන්ගේ ප්‍රතිපත්ති වල කැපී පෙනෙන ලක්ෂණ තුනක් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(07) (i) පහත සඳහන් සිදුවීම්වලට අදාළ පුද්ගලයින් A, B, C අනුපිළිවෙළින් නම් කරන්න.

A - ජෝන් ෆයිබස් උඩරටට පැමිණෙන අවධියේ උඩරට පාලනය කළ රජතුමා
B - ලංකාවේ ලන්දේසීන් සතු ප්‍රදේශ ඉංග්‍රීසීන්ට බාර දෙන ලෙස කිව් ලිපිය මගින් දන්වා එවන ලද ඕලන්ද පාලකයා
C - මැක්ඩෝවල්ගේ නායකත්වයෙන් උඩරටට දූත පිරිසක් පිටත් කළ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා (ලකුණු 03 යි)

(ii) මියුරන් කොමිසමේ සඳහන් නිර්දේශ දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) උඩරට රාජධානිය යටත් කර ගැනීම කෙරෙහි ඉංග්‍රීසීන්ගේ අවධානය යොමුවීමට බල පෑ හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) බ්‍රිතාන්‍ය පාලනය නිසා මෙරට ආර්ථිකයේ හා සමාජයේ ඇති වූ වෙනස්කම් තුනක් විස්තර කරන්න. (ලකුණු 06 යි)

III කොටස

(08) (i) කාර්මික විප්ලවයට සමගාමීව පහත සඳහන් නව නිපැයුම් ලෝකයට දායාද කළ පුද්ගලයින් A, B, C අනුපිළිවෙළින් නම් කරන්න.

A - මෝටර් රථය
B - ආරක්ෂක ලාම්පුව
C - දුම්රිය එන්ජිම (ලකුණු 03 යි)

(ii) කාර්මික විප්ලවය බ්‍රිතාන්‍යයේ ආරම්භ වීමට හේතු වූ කරුණු දෙකක් ලියන්න. (ලකුණු 04 යි)

(iii) කාර්මික විප්ලවයේ බලපෑම නිසා සන්නිවේදන ක්ෂේත්‍රයේ ඇති වූ දියුණුව නිදසුන් දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) කාර්මික විප්ලවය නිසා ශ්‍රී ලංකාවේ ඇති වූ වෙනස්කම් කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(09) (i) පහත A, B, C යටතේ දක්වා ඇති තොරතුරුවලට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් ලියන්න.

A - ජර්මන් අධිරාජ්‍යයක් පිහිටුවීමේ අරමුණින් ක්‍රියාකළ ජර්මන් අධිරාජයා
B - ජර්මන් සබ්මැරීනයක් මගින් ගිල්වා දැමූ ඇමෙරිකානු මගී නැව
C - ජර්මනියට දැඩි දඬුවම් පමුණුවන ලද ගිවිසුම (ලකුණු 03 යි)

(ii) ජාතීන්ගේ සංගමය සාමය සඳහා දැරූ ප්‍රයත්න සාර්ථක වූ අවස්ථා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) දෙවන ලෝක සංග්‍රාමයට තුඩුදුන් හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05 යි)


(iv) එක්සත් ජාතීන්ගේ සංවිධානය ලෝක සාමය රැකීම සඳහා ගත් ප්‍රයත්න තුනක් විස්තර කරන්න. (ලකුණු 06 යි)

Scanned with CamScanner

(01) (ඇ) (i)
(01) (அ) (i)
(01) (a) (i)



Scanned with CamScanner



(01) (ඇ) (ii)

(01) (ஆ) (ii)


(01) (a) (ii)

ඉතිහාසය
පිළිතුරු පත්‍රය
I පත්‍රය


1.	4	11.	3	21.	3	31.	2
2.	1	12.	1	22	4	32.	2
3.	2	13.	4	23.	1	33.	3
4.	3	14.	2	24.	2	34.	2
5.	2	15.	1	25.	4	35.	1
6.	4	16.	1	26.	2	36.	3
7.	1	17.	4	27.	3	37.	4
8.	2	18.	1	28.	3	38.	4
9.	4	19.	3	29.	4	39.	1
10.	3	20.	2	30.	1	40	2

(ලකුණු 2 × 40 = 80)

(01) (අ) (i) (ii) ලංකා හා ලෝක සිතියම්වල ලකුණු කර ඇත. (ලකුණු 12+6=18)



Scanned with CamScanner



(ආ) (i) A - රොබට් නොක්ස් B - හතරවන උදය රජතුමා
C - රොබට් බැක්වෙල් D - රතු ඉන්දියන්වරු (ලකුණු 04 යි)

(ii) 1 - පැරණි මැටි බඳුනක් 2 - රංචාමඩම 3 - පූර්ව ඓතිහාසික යුගය
4 - මැටි බඳුන් තැනීමේ තාක්ෂණය (මැටි තාක්ෂණය) (ලකුණු 04 යි)

(iii) 1 - වර්සේල්ස් මාලිගය 2 - ප්‍රංශයේ ය 3 - ප්‍රංශ විප්ලවය
4 - බූර්බොන් (ලකුණු 04 යි)

(02) (i) A- ප්ලීනි B- ඇරිස්ටෝටල් C- මෙගස්තීනිස් (ලකුණු 03 යි)

(ii)
- ඓතිහාසික කාල අනුපිළිවෙළ සකස් කර ගැනීමට
- එක් එක් අවධිවල, දේශපාලන, ආර්ථික, සමාජ, සංස්කෘතික කටයුතු පිළිබඳ තොරතුරු ලබා ගැනීම
- එක් මූලාශ්‍රයක් මගින් ලැබෙන තොරතුරු තවත් මූලාශ්‍රයක් මගින් සනාථ කර ගැනීමට
- රටක විදේශීය සබඳතා අධ්‍යයනය කිරීමට (මින් ප්‍රයෝජන දෙකක් ලිවීමට)

(ලකුණු 04 යි)

(iii)
- අඛණ්ඩ කාතියක් ලෙස දිගටම පැවතීම. දීප වංසය තිබියදීම අඩුපාඩු වඩා අඩු කෘතියක් වශයෙන් මහා වංසය රචනා වීම
- මූලාශ්‍රය රචනා කිරීමේ දී සීහලට්ඨ කථා මහාවංසය වැනි මුල් ග්‍රන්ථවල ආභාෂය ලබා තිබීම
- බුදුන් වහන්සේගේ ලංකා ගමනයේ සිට ඓතිහාසික තොරතුරු ගවේෂණය කළ හැකි වීම
- මහාවංසයේ ඇතැම් ඓතිහාසික සිදුවීම් ශිලාලිපි හා වෙනත් මූලාශ්‍රය මගින් තහවුරු වී තිබීම

මෙවැනි කරුණු දෙකක් කෙටියෙන් විස්තර කිරීම (ලකුණු 05 යි)

Scanned with CamScanner

(iv) • සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් නොවන කරුණු පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයවලින් අනාවරණය වීම.
• කාසි වැනි පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයවලින් එදා පැවති රටේ ආර්ථික තත්වය, වෙළෙඳාම, ලෝහ භාවිතය ආදී කරුණු අනාවරණය කරගත හැකි වීම
• පැරණි ගොඩනැගිලි, දාගැබ්, ගල් කණු, වැව්, පොකුණු ආදී නටබුන්වලින් පැරණි ජනතාවගේ නිර්මාණාත්මක හැකියාව, තාක්ෂණය, පැරණි සංස්කෘතිය වාස්තු විද්‍යාව පිළිබඳ වැදගත් තොරතුරු හෙළිකර ගත හැකිවීම.
• චිත්‍ර, මූර්ති හා පුරාවස්තුවලින් අතීත ජනතාවගේ ඇඳුම් පැළඳුම්, කලා කුසලතාව, ආභරණ පරිහරණය, වර්ණ භාවිතය, ආගමික විශ්වාසය, විදේශ සබඳතා ආදී බොහෝ අංශ පිළිබඳ තොරතුරු හෙළිකරගත හැකිවීම.
ආදී කරුණු විස්තර කිරීම. (ලකුණු 06 යි)

(03) (i) • වල්දෙල්, කැළෑ කෙසෙල්, ගෝනල, කටු අල ආදී වර්ග තුනක් ලිවීම. (ලකුණු 03 යි)

(ii) (a) • බණ්ඩාරවෙල, හෝර්ටන්තැන්න (දෙකක් ලිවීම) (ලකුණු 03 යි)
(b) • මිනිහාගල්කන්ද, බූන්දල, පතිරාජවෙල (දෙකක් ලිවීම) (ලකුණු 04 යි)

(iii) • රාවණාඇල්ල ගල් ගුහාවෙන් සොයාගත් මිනිස් හිස් කබලේ දෙකට බෙදෙන ලෙස සිදුරු විඳ තිබීම. හිස් කබලේ රළු දොර සහ පිටතට නෙරා තිබූ කොටස් ගලක උලා මට්ටම් කර එක් පැත්තක රතු පැහැති ගුරුගල් ආලේප කර තිබීම.
• පාහියන්ගල ගල් ගුහාවෙන් සොයාගත් මළ සිරුර එහි කොටස් දිරා යනතුරු යම් තැනක වළලා දමා පසුව සහ හිස්කබලේ රතු ගුරුගල් ආලේප කර තිබීම.
• කුරුවිට බටදොඹලෙනෙන් සොයාගත් ඇටසැකිලි නමා වකුටු කර වළලා තිබීම.

(iv) • මැටි බඳුන් නිපදවීමේ දී යොදාගත් ශිල්ප ක්‍රම
• නිවාස ඉදිකිරීමේ දී යොදාගත් තාක්ෂණය
• යකඩ නිපදවීමේ තාක්ෂණය
• ක්‍රමවත් සුසාන (මැටිඔරු සුසාන, මහාශිලා සුසාන) තැනීමේ තාක්ෂණය
මෙවැනි තාක්ෂණ ශිල්ප ක්‍රම උදාහරණ ඇතුලත්ව කරුණු තුනකින් විස්තර කිරීම
(ලකුණු 03 යි)

(04) (i) A ධාතුසේන රජතුමා B මහසෙන් රජතුමා C දෙවන මුගලන් රජතුමා

(ii) • බලංගොඩ සමනල වැව ප්‍රදේශය
• සීගිරියට ආසන්නව අලකොල වැව දෙහිගහ ඇළකන්ද ප්‍රදේශය
(ලකුණු 04 යි)

(iii) • පණ්ඩුකාභය රාජ්‍ය සමයේ මාතෘ නිවාස (සිවිකා සාලා) ගැන මහා වංශයේ සඳහන් වීම
• රෝහල් ඉදිකළ පාලකයින් පිළිබඳ තොරතුරු සඳහන් වීම (බුද්ධදාස රජතුමා, පස්වන මහින්ද රජතුමා, දුටුගැමුණු රජතුමා, හතරවන කාශ්‍යප රජතුමා)
• ආලාහන පිරිවෙන් සංකීර්ණයේ සහ මිහින්තලේ රෝහල්වල දියුණු ශල්‍ය වෛද්‍ය ක්‍රම පිළිබඳ තොරතුරු
(බෙහෙත් ඔරු/ වෛද්‍ය ග්‍රන්ථ/ ඔසුඋයන්)
• දක්ෂ වෛද්‍යවරු පිළිබඳ තොරතුරු/ පෙල්ලිපිවල සඳහන් තොරතුරු ආදී කරුණු නිදසුන් දෙකක් ඇතුලත්ව විස්තර කිරීම (ලකුණු 05 යි)

(iv) • වැවේ විවිධ අංග සහ එහි තාක්ෂණය (වැව් බැම්ම, බිසෝකොටුව, සොරොව්ව, රළපනාව)
• මින් අංග තුනක් සඳහන් කර එහි තාක්ෂණය විස්තර කිරීම
• ඇළ මාර්ග හා බැඳුනු තාක්ෂණය (ගංගා හරස්කර අමුණු බැඳ ජලය රැස්කිරීම/ ඇළහැර අමුණ/ මිනිපේ අමුණ ආදී.....)
• යෝධ ඇළ හෙවත් ජය ගඟෙහි ජලය රැගෙන යාමේ තාක්ෂණය (ලකුණු 06 යි)

Scanned with CamScanner

(05) (i) රජු, රජයේ නිලධාරීන්, ගිහි ප්‍රභූන්, බෞද්ධසංඝරත්නය තිදෙනෙක් නම් කිරීම
(ලකුණු 03 යි)

(ii) A හේන් වගා කිරීම සඳහා B වැව්වල ජලය භාවිත කිරීම වෙනුවෙන්
C රජුට අයත් ඉඩම්වල වගා කිරීම වෙනුවෙන්
D ඇළ මාර්ගවල මත්ස්‍යයින් ඇල්ලීම වෙනුවෙන් (ලකුණු 04 යි)

(iii)
- ලෝහ කර්මාන්තය (යකඩ, රන්)
- මැණික් කර්මාන්තය
- මැටි භාණ්ඩ කර්මාන්තය
- රෙදි විවීමේ කර්මාන්තය මේ ආදී කර්මාන්ත දෙකක් පිළිබඳ විස්තර කිරීම
(ලකුණු 05 යි)

(iv)
- දේශීය ධාන්‍ය, අලවර්ග, එලවළු ආහාරයට ගත් බව
- නිවුඩු හාලේ බත් පලා වර්ග ආහාරයට ගත් බව
- ආහාර රසවත් කිරීමට රස කාරක ලෙස කුළුබඩු කරපිංචා ඇඹුල් වර්ග, දුන්තෙල්, හිතෙල්, පොල්තෙල් භාවිත කළ බව
- විවිධ කැඳ වර්ග භාවිතය
- සතුන්ගේ මස් මෙන්ම මාළු ආහාරයට ගත් බව
මෙවැනි කරුණු ඇසුරින් විස්තර කිරීම (ලකුණු 06 යි)

(06) (i) ශ්‍රී විජය රාජසිංහ රජු, කීර්ති ශ්‍රී රාජසිංහ රජු, රාජාධි රාජසිංහ රජු, ශ්‍රී වික්‍රම රාජසිංහ රජු මෙම රජවරුන්ගෙන් තිදෙනෙකු නම් කිරීම (ලකුණු 03 යි)

(ii)
- ගොවිතැන දියුණු කිරීමට කටයුතු කිරීම
- කපු වගාව දියුණු කිරීමට අනුබල දීම
- කොත්මලේ හා වලපනේ ප්‍රදේශයේ යකඩ හා වානේ කර්මාන්තය දියුණු කිරීම
- උඩරට රාජ්‍යය ආශ්‍රිත වෙඩිලුණු කර්මාන්තයේ දියුණුවට පියවර ගැනීම
මින් කරුණු දෙකක් ලිවීමට (ලකුණු 04 යි)

(iii)
- උඩරට ජනතාව හැම විටම රජුට සහාය දීම
- පෘතුගීසීන් වෙනුවෙන් සටන් කිරීමට ගිය පහත රටියන් උඩරට දී රජුට එකතු වීම (ලස්කිරිඤ්ඤ හමුදාව හෙවත් කුලියට ගත් හමුදාව) (ලකුණු 04 යි)
- උඩරටියන්ගේ සටන් උපක්‍රම (සැඟව සිට පහරදීම උපායශීලී පසුබැසීම් වැනි අවස්ථා) හා රජවරුන්ගේ උපාය කෞශල්‍යය
- උඩරට රාජධානියේ ස්වාභාවික පිහිටීම (ජල දුර්ග, ගිරි දුර්ග, වන දුර්ග)
(ලකුණු 05 යි)

(iv)
- උඩරට රජු සමග සාමකාමීව කටයුතු කිරීමට ලන්දේසීන් උත්සාහ දැරීම
- උඩරට රජුගේ හොඳ හිත දිනාගැනීමට විවිධ කටයුතු සිදු කිරීම හා කුරුඳු ලන්දේසීන් වෙත පමණක් ලබා ගැනීමට අපේක්ෂා කිරීම
- ආගමික කටයුතුවලට සහයෝගය දීම (උපසම්පදාව)
- වෙනත් විදේශිකයන් සමග උඩරට රජු වෙළෙඳ සබඳතා පැවැත්වීම ලන්දේසීන් විසින් අවහිර කිරීම
- කුරුඳු වගා කරවීම, වී වගාව දියුණු කිරීම, උක්, කෝපි, කපු ආදිය වගා කිරීම
මෙවැනි කරුණු තුනක් විස්තර කිරීම (ලකුණු 06 යි)

(07) (i) A කීර්ති ශ්‍රී රාජසිංහ රජු B පස්වන විලියම් C පෙඩ්රික් නොර්ත්
(ලකුණු 03 යි)

(ii)
- බදු එකතු කිරීමට නැවත දේශීය නිලධාරීන් යොදවා ගැනීම
- පොල් ගස් බද්ද ඇතුළු අලුත් බදු වර්ග ඉවත් කිරීම
- ආදායම් එකතු කිරීමට හා අධිකරණ කටයුතු සඳහා වෙන වෙනම නිලධාරීන් පත් කිරීම
- ලන්දේසි උසාවි ක්‍රමය නැවත පිහිටුවීම, මින් දෙකක් ලිවීම (ලකුණු 04 යි)

Scanned with CamScanner

(iii)
- උඩරට ස්වාධීන රාජ්‍යයක් පැවතීම මුහුදුබඩ ප්‍රදේශවල ඉංග්‍රීසි පාලනයට බාධාවක් වීම
- වෙරළබඩ ප්‍රදේශ ආරක්ෂා කිරීමට හමුදා යෙදවීමට අමතරව අභ්‍යන්තර දේශ සීමා ආරක්ෂාවට හමුදා යෙදවීමට විශාල වියදමක් දැරීම
- මුහුදුබඩ ප්‍රදේශවල වැසියන් ද උඩරට රජු තමන්ගේ රජු ලෙස සැලකීම
- මුහුදුබඩ ප්‍රදේශවල ඉංග්‍රීසීන්ට විරුද්ධව කැරලි ඇති වූ විට උඩරට රජු කැරලිකරුවන්ට ආධාර දීම
- උඩරට රජු ප්‍රංශ ජාතීන්ගෙන් ආධාර ඉල්ලා සිටියහොත් ඉංග්‍රීසීන්ගේ පාලනයට තර්ජනයක් වෙතැයි සැක සිතීම
- කොළඹ පාලන මධ්‍යස්ථානය හා ත්‍රිකුණාමලය නාවික මධ්‍යස්ථානය අතර ගොඩබිමෙන් සබඳතා පැවැත්වීමට උඩරට රාජ්‍යය බාධාවක් වීම

මෙවැනි කරුණුවලින් දෙකක් විස්තර කිරීම (ලකුණු 05 යි)

(iv) **ආර්ථිකය**

- සම්ප්‍රදායික ස්වයංපෝෂිත ආර්ථිකය බිඳ වැටීම
- ආනයන අපනයන ආර්ථිකයට හුරුවීම
- වැවිලිබෝග ආර්ථිකයේ ප්‍රධාන තැනක් ගැනීම

සමාජය

- මධ්‍යම පන්තියක් බිහිවීම
- කම්කරු පන්තියක් බිහිවීම
- බටහිර සංස්කෘතිය පැතිරයාම හා සාම්ප්‍රදායික සංස්කෘතික ලක්ෂණවල යම් පිරිහීමක් ඇතිවීම
- මධ්‍යසාර භාවිතයට මිනිසුන් හුරුවීම නිසා පවුල් ගැටලු ඇතිවීම

මෙවැනි කරුණු තුනක් විස්තර කිරීම (ලකුණු 06 යි)

(08) (i) A ඩෙම්ලර් B හම්ප්‍රිඩේවි C ජෝර්ජ් ස්ටීවන්සන් (ලකුණු 03 යි)

(ii)
- කර්මාන්ත සඳහා මුදල් ආයෝජනය කළ හැකි ධනවතුන් පිරිසක් සිටීම
- බ්‍රිතාන්‍යයේ ජනගහන වර්ධනය අධික වීම නිසා භාණ්ඩ සඳහා ඉල්ලුම වැඩිවීම
- යන්ත්‍ර සූත්‍ර තැනවීමට අවශ්‍ය යකඩ හා වානේ වැනි ඛනිජ සම්පත් පැවතීම
- බල ශක්තිය සඳහා අවශ්‍ය ගල් අඟරු සුලබ වීම

තවත් කරුණු සඳහා 11 ශ්‍රේණිය ඉතිහාසය පිටුව 1 සහ 2 බලන්න
කරුණු දෙකක් ලිවීමට (ලකුණු 04 යි)

(iii)
- එංගලන්තයේ "පෙනී තැපැල් සේවය" ආරම්භ වීම
- සැමුවෙල් මෝස් විසින් විදුලි පණිවුඩ ක්‍රමය සොයා ගැනීම
- ගුග්ලි මාර්කෝනි ගුවන් විදුලි පණිවුඩ ක්‍රමය සොයා ගැනීම
- ජෝන් ලොගී බෙයාර්ඩ් රූපවාහිනිය සොයා ගැනීම
- ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල් දුරකථනය සොයාගැනීම

මෙවැනි කරුණු දෙකක් විස්තර කිරීම (ලකුණු 05 යි)

(iv)
- මෙරට වතු වගාව ආරම්භ වීම
- කම්කරු පන්තියක් හා උගත් ධනවත් මධ්‍යම පන්තියක් බිහිවීම
- ධනවාදී ආර්ථික ක්‍රමයක් ව්‍යාප්ත වීම
- බැංකු, දුම්රිය මාර්ග, මහාමාර්ග, රාජකාරී තැපැල් සේවය, ටෙලිග්‍රාෆ් සේවය, බැංකු ක්‍රමය ආදී වෙනස්කම් තුනක් පැහැදිලි කිරීම (ලකුණු 06 යි)

Scanned with CamScanner

(09) (i) A දෙවන විලියම් B ලුසිටානියා නැව C වර්සේල්ස් ගිවිසුම

(ලකුණු 03 යි)

(ii)
- ස්විඩනය හා පින්ලන්තය, ජර්මනිය හා පෝලන්තය, ග්‍රීසිය හා බල්ගේරියාව, ඉරානය හා තුර්කිය වැනි රටවල් අතර ඇති වූ යුද ගැටුම් වැළැක්වීම
- සරණාගතයන් පුනරුත්ථාපනය සඳහා මැදිහත්ව කටයුතු කිරීම
- පළමුවන ලෝක යුද්ධයෙන් පසුව ජාතීන්ගේ සංගමයේ භාරකාරත්වයට පත්කොට තිබූ යටත් විජිත පිළිබඳ අධීක්ෂණ කටයුතු සාර්ථකව සිදු කිරීම
- නීති විරෝධී වහල් වෙළෙඳාම හා මත්ද්‍රව්‍ය වෙළෙඳාම අඩපණ කිරීමට අවශ්‍ය කටයුතු කිරීම මින් දෙකක් ලිවීම.

(ලකුණු 04 යි)

(iii)
- ජර්මනියේ හිට්ලර් බලවත්වීම හා ඔහුගේ ක්‍රියාකලාපය
- ඉතාලියේ මුසෝලිනීගේ ක්‍රියාකලාපය
- ජපානයේ ක්‍රියාකලාපය
- ජාතීන්ගේ සංගමයේ පැවති දුර්වලතා
- මින් හේතු දෙකක් විස්තර කිරීම (ලකුණු 05 යි)

(iv)
- සූවස් අර්බුදය
- ගල්ෆ් අර්බුධය
- කියුබානු මිසයිල අර්බුධය

මෙම අර්බුධ තුන විසඳූ ආකාරය කෙටියෙන් විස්තර කර තිබීම (ලකුණු 06 යි)

Scanned with CamScanner